**<u>වර්ෂ 2022 ක් වූ පෙබරවාරි මස 24 වන දින පෙ.ව 10.00 ට පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ වාර්තාව</u>**

<u>පැමිණීම</u>

01. ගරු සභාපති - ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
02. ගරු උප සභාපති - එච්.ඒ නන්දසෝම මහතා
03. ගරු මන්ත්‍රී - වී.මුරලිදරන් මහතා
04. ගරු මන්ත්‍රී - ශාන්තලාල් පෙරේරා මහතා
05. ගරු මන්ත්‍රී - ජී.එස්.ඒ ෆොන්සේකා මහතා
06. ගරු මන්ත්‍රී - කේ.ඕ.සෝමතිලක මහතා
07. ගරු මන්ත්‍රී - එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා
08. ගරු මන්ත්‍රී - ජී.කේ.පී ෆොන්සේකා මිය
09. ගරු මන්ත්‍රී - ටී.ඒ.ඩී.සී දමයන්ති මිය
10. ගරු මන්ත්‍රී - එච්.ජී මෛත්‍රීපාල මහතා
11. ගරු මන්ත්‍රී - එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය
12. ගරු මන්ත්‍රී - අයි.රාමකිලි මහතා
13. ගරු මන්ත්‍රී - ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා
14. ගරු මන්ත්‍රී - කේ.ඕ කුසුම්ලතා මිය
15. ගරු මන්ත්‍රී - එස්.එල්.අරුණ ශාන්ත මහතා
16. ගරු මන්ත්‍රී - එන්.එම් සුසිලා දමයන්ති මිය
17. ගරු මන්ත්‍රී - එච්.ජී මහින්ද ගුණසේකර මහතා
18. ගරු මන්ත්‍රී - එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා

<u>නොපැමිණීම</u>

01. ගරු මන්ත්‍රී - එච්.ඒ.එන්.සී රණසිංහ මහතා
02. ගරු මන්ත්‍රී - පූජ්‍ය නමඩගස්වැව සුගතසෝම හිමි

**<u>01. පසුගිය මහා සභා වාර්තාව හා අයවැය සම්මත කිරිමේ වාර්තාව සභා සම්මත කිරිම</u>**

<u>ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා</u>

සභා වාර්තාව සභා සම්මත කරන්න බෑ.තියෙන්නේ 2022 අයවැය යෝජනාව අනුව පෙර පාසල් නිල ඇඳුම් ලබා දීම සඳහා කියලා තිබුනට 2022 අයවැයක් සම්මත වෙලා නැනෙ තාම.අනිත් කාරණය තමයි පළාත් පාලන සහකාර කොමසාරිස්තුමියගේ වාර්තාව සභාවට ඉදිරිපත් කරා කියලා තියෙනවා.සභාවට ඉදිරිපත් කළේ නෑ.සභාව ඉවර වෙලා තමයි අපිට දුන්නේ.සහකාර කොමසාරිස්තුමිය හා ලේකම්තුමිය කිව්වේ අත්‍යාවශ්‍ය වියදම් විතරක් ගෙවමු කියලා.නමුත් ලේකම්තුමියත් බොරු කරා අපිට.

<u>ගරු මන්ත්‍රී ටී.ඒ.ඩී.එස් දමයන්ති මිය</u>

2021.12.17 හා දෙසැම්බර් මස මහා සභා වාර්තාව සංශෝධන සහිතව නිවැරදි වාර්තාවක් වශයෙන් සභා සම්මත කරමු කියලා යෝජනා කරාට 12/17 සභා වාර්තාව අපිට ලැබුනේ නෑ.නොදුන්න එකක් පිළිබඳ අපිට කථා කරන්න බෑ.අයවැය සභාව ඉවර උනාම තමයි අපිට දෙනවා කිව්වේ.ඒ නිසා අපි මේකට විරුද්ධ වෙනවා.

<u>ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා</u>

ඒ වගෙම තමයි දෙවරක් අයවැය පරාජය උනාම උප සභාපතිතුමා තමයි සභාපති ධුරය දරන්න ඕනි.ඒක උනෙත් නෑ.සභාව ගෙනියන්නේ වැරදි ආකාරයට.

<u>ගරු මන්ත්‍රී එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය</u>

සභාවේ කිසිම ටෙන්ඩර් එකකට අපි අත්සන් කළේ නෑ.නමුත් ටෙන්ඩර් එක ඒකමතිකව සභා සම්මත උනා කියලා තියෙනවා.ලේකම්තුමිය හිතාමතාම ඒක කරනවද කියලා හිතෙනවා.12/17 වාර්තාව න්‍යාය පත්‍රයට ඇවිල්ලත් නෑ.ෆොන්සේකා මන්ත්‍රීතුමා සභා වාර්තාව යෝජනා කරනකොට මහා සභා වාර්තාව හා 12/17 විශේෂ මහා සභා වාර්තාව සභා සම්මත කරනවා කියලා කිව්වෙත් නෑ.

<u>ගරු මන්ත්‍රී එන්.එම්.එස් දමයන්ති මිය</u>

කාරක සභා ගැන සඳහන් කරලා තියෙනවා.නමුත් කාරක සභා පිහිටෙව්වද කියලා වත් අපි දන්නේ නෑ.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>

පළාත් පාලන සහකාර කොමසාරිස්තුමියගේ වාර්තාව ඔබතුමන්ලාගේ ඉල්ලීම අනුව තමයි දුන්නේ.සභාවට දාන ලියුම් අපි කවදාවත් ජායාපිටපත් ඔබතුමන්ලාට දීලා නැනේ.

<u>ගරු මන්ත්‍රී ටී.ඒ.ඩී.එස් දමයන්ති මිය</u>

ලියුම් ප්‍රශ්නයක් නෑ.අයවැය නිසා තමයි ඉල්ලුවේ.

<u>ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා</u>

සහකාර කොමසාරිස්තුමියත් කිව්ව විධියට නෙවෙයිනේ වාර්තාව එවලා තියෙන්නේ.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>

ඒක ඔබතුමාලා සහකාර කොමසාරිස්තුමියගෙන් විමසීමක් කරන්න.සහකාර කොමසාරිස්තුමිය වැරදි කියලා හිතෙනවා නම් ආණ්ඩුකාරතුමාට පැමිණිලි කරන්න.

<u>ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා</u>

අපි ඒ සම්බන්ධව නීතිමය කටයුතු කරලා තියෙන්නේ.

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>

2022 අයවැය සම්මත කරගන්න බැරි උන නිසා පළාත් පාලන කොමසාරිස්තුමා මැදිහත් වෙලා සභාවේ කටයුතු අවිච්ඡින්නව පවත්වා ගෙන යන්න අයවැයක් සම්මත කරලා දුන්නා.සභාවේ අයවැය නෙවෙයි මේ සම්මත වෙලා තියෙන්නේ.සහකාර කොමසාරිස්තුමිය පවරලා තියෙන බලතල යටතේ ඉදිරි කටයුතු කරගෙන යමු.

<u>ගරු මන්ත්‍රී ටී.ඒ.ඩී.එස් දමයන්ති මිය</u>

12/17 සභා වාර්තාව සම්මත උනා කියලා කියන්න බැනේ.සහකාර කොමසාරිස්තුමිය කිව්ව දේට විතරයි අපි එකඟ උනේ.

<u>ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා</u>

පසුගිය ගෙවීම් සියල්ල කරලා තියෙන්නේ සහකාර කොමසාරිස්තුමිය කිව්ව විධියට තමයි.

<u>ගරු මන්ත්‍රී ජී.එස්.ඒ ෆොන්සේකා මහතා</u>

2022 ජනවාරි මස 27 වන දින මහා සභා වාර්තාව සංශෝධන සහිතව සත්‍ය හා නිවැරදි වාර්තාවක් වශයෙන් සභා සම්මත කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව 2022 ජනවාරි මස 27 වන දින මහා සභා වාර්තාව සංශෝධන සහිතව සත්‍ය හා නිවැරදි වාර්තාවක් වශයෙන් සභා සම්මත කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

**02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන**

02 - 01 ප්‍රාදේශීය ලේකම්,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,නාවලපිටිය
2022 අයවැය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 02 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
2022 සභා අරමුදල් 2022.02.23 දිනට ප්‍රගතිය යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 03 පළාත් පාලන සහකාර කොමසාරිස්,පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය,පල්ලේකැලේ
පූර්ණ පරික්ෂණ වාර්තාව - 2020 යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 04 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කඩියන්ලෙන බාරන්ඩාවත්ත ශ්‍රී සුබ්‍රමනියම් දේවාලයේ (බාරන්ඩා ශ්‍රී මුරුගන් දේවාලයේ )සංවර්ධන කටයුතු වෙනුවෙන් රු:29912/- ක මුදලක් සභා අරමුදලින් දැරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 05 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ හයිඩ්‍රි වත්ත ශ්‍රී බෝධිරාජ විහාරස්ථානයේ ධර්ම ශාලාවේ පොලව සුද දමා අලුත්වැඩියා කර ප්‍රතිසංස්කරණය කිරිම වෙනුවෙන් රු:98667.80 ක මුදලක් සභා අරමුදලින් දැරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 06 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ හයිඩ්‍රි වත්ත ශ්‍රී බෝධිරාජ විහාරස්ථානය වෙත තණකොළ කපන යන්ත්‍රයක් ලබා දීම වෙනුවෙන් රු:19990.00 ක මුදලක් සභා අරමුදලින් දැරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 07 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ හයිඩ්‍රි වත්ත ශ්‍රී බෝධිරාජ විහාරයේ ධර්ම ශාලාවේ ඉදිරිපස වහලය ඉදිකිරිම වෙනුවෙන් රු: 99143.36 මුදලක් සභා අරමුදලින් දැරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 08 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරිම - මධ්‍යම පළාත යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 09 ප්‍රධාන ලේකම්,ප්‍රධාන ලේකම් කාර්යාලය,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
ප්‍රායෝජික පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් බඳවා ගැනීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 10 කෘෂිකර්ම අමාත්‍ය ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා,රජමල්වත්ත පටුමග,බත්තරමුල්ල
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට එක් ග්‍රාමීය ක්‍රීඩාංගනයක් හා අධ්‍යාපන කලාපයකට එක් පාසල් ක්‍රීඩාංගනයක් සංවර්ධනය කිරිම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 11 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් සිදු කරනු ලබන නායයෑම් සේවාවන් සඳහා අයකරනු ලබන ගාස්තු සංශෝධනය කිරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 12 ප්‍රාදේශීය ලේකම්,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,නාවලපිටිය
ප්‍රාදේශීය සෞඛ්‍ය කමිටු වාර්තාව යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 13 ප්‍රධාන ලේකම්,ප්‍රධාන ලේකම් කාර්යාලය,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කඩියන්ලෙන බාරන්ඩාවත්ත ශ්‍රී සුබ්‍රමනියම් දේවාලයේ (බාරන්ඩා ශ්‍රී මුරුගන් දේවාලයේ )සංවර්ධන කටයුතු වෙනුවෙන් රු:29912/- ක මුදලක් සභා අරමුදලින් දැරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 14 ලේකම්,ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ හයිඩ්‍රි වත්ත ශ්‍රී බෝධිරාජ විහාරයේ ධර්ම ශාලාවේ ඉදිරිපස වහලය ඉදිකිරීම වෙනුවෙන් රු:99143.36 ක මුදලක් සභා අරමුදලින් දැරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 15 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
තාක්ෂණ නිලධාරි සේවයේ පුරප්පාඩු සම්බන්ධවයි යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 16 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
ළමා අයිතිවාසිකම් පිළිබඳ පළාත් මෙහෙයුම් කමිටු තීරණ ක්‍රියාත්මක කිරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 17 පළාත් පාලන සහකාර කොමසාරිස්,පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
2021.09.23 දිනැති මහා සභා වාර්තාව සම්බන්ධයෙන් නිරික්ෂණ ඉදිරිපත් කිරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 18 පළාත් පාලන සහකාර කොමසාරිස්,පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
2021.10.28 දිනැති මහා සභා වාර්තාව සම්බන්ධයෙන් නිරික්ෂණ ඉදිරිපත් කිරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 19 පළාත් පාලන සහකාර කොමසාරිස්,පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
2021.12.30 දිනැති මහා සභා වාර්තාව සම්බන්ධයෙන් නිරික්ෂණ ඉදිරිපත් කිරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 20 ලේකම්,පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය,යූනියන් පෙදෙස,කොළඹ 02
පළාත් පාලන ආයතන කාර්ය සාධන තරගය - 2022 යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 21 පළාත් පාලන සහකාර කොමසාරිස්,පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
PVC අපද්‍රව්‍ය එකතු කිරීමේ කාර්යයට සහයෝගය ලබා ගැනීම සඳහා යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 22 අධ්‍යක්ෂ,මධ්‍යම පරිසර අධිකාරිය,බත්තරමුල්ල
විෂයගත කමිටු රැස්වීම - යෝජිත කිරිගව ව්‍යාපෘතිය,ගලබඩ වත්ත,නාවලපිටිය යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 23 පළාත් පාලන සහකාර කොමසාරිස්,පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
ප්‍රාදේශීය සභා කාර්යාලයේ පළමු මහල ශ්‍රවනාගාරයක් ලෙස වැඩිදියුණු කිරීම - බිල්පත් ප්‍රතිපූර්ණයට යොමු කිරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 24 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පළාත් සභා සංකීර්ණය,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
ප්‍රාදේශීය සභා කාර්යාලයේ පළමු මහල ශ්‍රවනාගාරයක් ලෙස වැඩිදියුණු කිරීම - බිල්පත් ප්‍රතිපූර්ණයට යොමු කිරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 25 ලේකම්,ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය,පල්ලේකැලේ,කුණ්ඩසාලේ

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් නාවලපිටිය හෝල්ගම ශ්‍රී සුදර්ශනාරාම විහාරස්ථානයේ ආවාසයේ ඉහළ මහල සංවර්ධනය කිරිම වෙනුවෙන් රු:122646.16 ක මුදලක් සභා අරමුදලින් දැරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 26 ලේකම්,ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය,පල්ලේකැලේ,කුණ්ඩසාලේ

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නාවලපිටිය,බච්චාගම,ඉඹුල්පිටිය බච්චාගම මරණාධාර සමිතිය සඳහා ශබ්ද විකාශන යන්ත්‍රයක් ලබා දීම වෙනුවෙන් රු:45900.00 ක මුදලක් සභා අරමුදලින් දැරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 27 ලේකම්,ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය,පල්ලේකැලේ,කුණ්ඩසාලේ

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ හයිඩ්‍රි වත්ත ශ්‍රී බෝධිරාජ විහාරස්ථානයේ ධර්ම ශාලාවේ පොලව සුද දමා අලුත්වැඩියා කර ප්‍රතිසංස්කරණය කිරිම වෙනුවෙන් රු:98667.80 ක මුදලක් සභා අරමුදලින් දැරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 28 ලේකම්,ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය,පල්ලේකැලේ,කුණ්ඩසාලේ

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නාවලපිටිය බච්චාගම සිරි ධම්මරථන පිරිවෙන් විහාරස්ථානයේ ධර්ම ශාලාවේ ජනෙල් සඳහා ග්‍රිල් සවි කිරිම වෙනුවෙන් රු:122034.90 ක මුදලක් සභා අරමුදලින් දැරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 29 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ

2022.01.27 වැනි දින පැවති ප්‍රජා සංවර්ධන නිලධාරින්ගේ මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 30 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ

1988 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරිමේ පනත යටතේ ලබා දී ඇති හිමිකම් සහතික අභියෝගයට ලක් කිරිම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 31 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ

විදේශ නිවාඩු සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 32 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ

Reducing Of Energy Consumption On Lighting Street Lamps – An Energy Conservation Effort යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 33 අධ්‍යක්ෂ ජනරාල්,ශ්‍රී ලංකා සුනිත්‍ය බල ශක්ති අධිකාරිය,කොළඹ 07

පවතින විදුලි අර්බුදය හමුවේ වීථි ලාම්පු වල ක්‍රියාකාරිත්වය කාර්යක්ෂම හා බලශක්ති සංරක්ෂණය වන ආකාරයට සිදු කිරිම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 34 ප්‍රධාන ලේකම්,ප්‍රධාන ලේකම් කාර්යාලය,පල්ලේකැලේ,කුණ්ඩසාලේ

ප්‍රාදේශීය සභා කාර්යාලයේ පළමු මහල ශ්‍රවනාගාරයක් ලෙස වැඩි දියුණු කිරිම - බිල්පත් ප්‍රතිපූර්ණයට යොමු කිරිම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 35 මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලේකම්,ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,මහනුවර

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ හයිඩ්‍රි වත්ත ශ්‍රී බෝධිරාජ විහාරස්ථානයේ ධර්ම ශාලාවේ පොලව සුද දමා අලුත්වැඩියා කර ප්‍රතිසංස්කරණය කිරිම වෙනුවෙන් රු:98667.80 ක මුදලක් සභා අරමුදලින් දැරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 36 මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලේකම්,ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,මහනුවර

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ හයිඩ්‍රි වත්ත ශ්‍රී බෝධිරාජ විහාරස්ථානය වෙත තණකොළ කපන යන්ත්‍රයක් ලබා දීම වෙනුවෙන් රු:19990.00 ක මුදලක් සභා අරමුදලින් දැරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 37 මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලේකම්,ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,මහනුවර
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කඩියන්ලෙන බාරන්ඩාවත්ත ශ්‍රී සුබ්‍රමනියම් දේවාලයේ (බාරන්ඩා ශ්‍රී මුරුගන් දේවාලයේ )සංවර්ධන කටයුතු වෙනුවෙන් රු:29912/- ක මුදලක් සභා අරමුදලින් දැරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 38 මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලේකම්,ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,මහනුවර
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ හයිඩ්‍රි වත්ත ශ්‍රී බෝධිරාජ විහාරයේ ධර්ම ශාලාවේ ඉදිරිපස වහලය ඉදිකිරිම වෙනුවෙන් රු: 99143.36 ක මුදලක් සභා අරමුදලින් දැරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 39 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
මාර්ගයක් සඳහා කුඹුරු ඉඩමකින් කොටසක් අත්කර ගැනීම - ගලේවෙල ප්‍රාදේශීය සභාව යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 40 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
ගරු විෂයය භාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීම - පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 41 ප්‍රාදේශීය ලේකම්,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,නාවලපිටිය
ප්‍රාදේශීය සෞඛ්‍ය කමිටු වාර්තාව යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 42 දිස්ත්‍රික් ලේකම්,දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,මහනුවර
මහනුවර දිස්ත්‍රික් ඩෙංගු කමිටු තීරණ දැනුම් දීම - 2022.02.01 යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 43 අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි,පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය,කොළඹ 07
ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 44 විධායක ඉංජිනේරු,විධායක ඉංජිනේරු කාර්යාලය,මාර්ග සංවර්ධන අධිකාරිය,කඩුගන්නාව
අනවසර ඉදිකිරිම් ඉවත් කරන ලෙස කරනු ලබන නිවේදනය යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 45 විධායක ඉංජිනේරු,විධායක ඉංජිනේරු කාර්යාලය,මාර්ග සංවර්ධන අධිකාරිය,කඩුගන්නාව
අනවසර ඉදිකිරිම් ඉවත් කරන ලෙස කරනු ලබන නිවේදනය යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 46 විධායක ඉංජිනේරු,විධායක ඉංජිනේරු කාර්යාලය,මාර්ග සංවර්ධන අධිකාරිය,කඩුගන්නාව
අනවසර ඉදිකිරිම් ඉවත් කරන ලෙස කරනු ලබන නිවේදනය යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 47 පළාත් පාලන සහකාර කොමසාරිස්,පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
පළාත් පාලන දේශපාලන ක්‍රියාවලිය තුළ කාන්තා සහභාගීත්වය ශක්තිමත් කිරිම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 48 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
පළාත් සභා හා රේඛීය අමාත්‍යාංශයේ සංවර්ධන ව්‍යාපෘති ප්‍රගති - 2021.12.31 යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

**03. මහජන පෙත්සම්, පැමිණිලි හා ලිපි ඉදිරිපත් කිරිම**

03 - 01 උඩරඹුක්පිටිය ගම්මානයේ ජනතාව

උඩ රඹුක්පිටිය පතනේකුඹුර ජලනල පද්ධතිය අලුත්වැඩියාව සම්බන්ධවයි යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

## 04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න

නැත

## 05. යථා පරිදි කල් දී ඇති යෝජනා

05 - 01 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

2022 වර්ෂය සඳහා කාර්යාලයේ සේවය කරන කාර්යාල කාර්ය සේවකයින් සඳහා ගෙවන නිල ඇඳුම් දීමනාව (රා.ප.ච 05/2013 අනුව) හා ගලබඩ දිය ඇල්ලේ රාජකාරියේ නියුතු සේවකයින් සඳහා නිල ඇඳුම් ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව අනුව 2022 වර්ෂය සඳහා කාර්යාලයේ සේවය කරන කාර්යාල කාර්ය සේවකයින් සඳහා ගෙවන නිල ඇඳුම් දීමනාව (රා.ප.ච 05/2013 අනුව) හා ගලබඩ දිය ඇල්ලේ රාජකාරියේ නියුතු සේවකයින් සඳහා නිල ඇඳුම් ලබා දීම සඳහා ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

05 - 02 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

2021.12.31 වන දිනට ආණ්ඩුවේ ද්‍රව්‍ය පිළිබඳ වාර්ෂික දෙපාර්තමේන්තු සමීක්ෂණය මා විසින් ඉදිරිපත් කරනු ලබන අතර එකී වාර්තාවේ සඳහන් නිර්දේශ අනුව කටයුතු කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී වී.මුරලිදරන් මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව අනුව 2021.12.31 වන දිනට සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණය අනුව එම මණ්ඩලයේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

05 - 03 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

මෙම සභාවේ 2021.12.31 වන දිනට අපහරණය කළ යුතු භාණ්ඩ හා වෙන්දේසි කළ යුතු භාණ්ඩ පිළිබඳ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ අනුව එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා (අපහරණය කළ යුතු භාණ්ඩ හා උපකරණ තක්සේරු කිරීමේ කාර්යය ඇතුළුව) පහත නම් සඳහන් අයගෙන් සමන්විත මණ්ඩලයක් පත් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

- ප්‍රජා සංවර්ධන නිලධාරි ලාල් හේරත් මයා - සභාපති
- තාක්ෂණ නිලධාරි එම්.ජී සුමනනන්ද මයා - සාමාජික
- පරිසර නිලධාරි ඩී.එම්.එස්.ඩී දිසානායක මයා - සාමාජික
- ආදායම් පරීක්ෂක ඉෂානි දිඹුල්කුඹුර මෙය - සාමාජික
- අභ්‍යන්තර විගණන නිලධාරි යමුනා ප්‍රියදර්ශනී මිය - සාමාජික

ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

05 - 04 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

2021.12.31 වන දිනට රඹුක්පිටිය මහජන පුස්තකාලයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මා විසින් ඉදිරිපත් කරනු ලබන අතර සමීක්ෂණ මණ්ඩලය විසින් ලබා දුන් එකී වාර්තාවේ සඳහන් නිර්දේශ අනුව කටයුතු කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී වී.මුරලිදරන් මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව අනුව 2021.12.31 වන දිනට රඹුක්පිටිය මහජන පුස්තකාලයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව එම මණ්ඩලයේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

<u>05 - 05 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය විසින් අනුමත කරන ලද 2022 වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය අනුව 609 - 3 - I යටතේ ආදර්ශ පෙර පාසල සඳහා වෙන් කර ඇති රු:ලක්ෂ 2 මුදලින් සභාව මගින් පවත්වා ගෙන යනු ලබන පෙර පාසලේ ළමුන් සඳහා නිල ඇඳුම් ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ජී.එස්.ඒ ෆොන්සේකා මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය විසින් අනුමත කරන ලද 2022 වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය අනුව 609 - 3 - I යටතේ ආදර්ශ පෙර පාසල සඳහා වෙන් කර ඇති රු:ලක්ෂ 2 මුදලින් සභාව මගින් පවත්වා ගෙන යනු ලබන පෙර පාසලේ ළමුන් සඳහා නිල ඇඳුම් ලබා දීම සඳහා ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

<u>05 - 06 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
බලයලත් මිනින්දෝරු පී.ඥානප්‍රකාශම් මහතා විසින් පහත සඳහන් මාර්ගයන්හි මිනින්දෝරු සැලැස්ම සකස් කර ඇති හෙයින් එම මාර්ග රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

- ගෝනාවලපතන සුසාන භූමි මාර්ගයේ සිට දඩුබැදිරුප්ප පාලම දක්වා මාර්ගය
- ෂෙම්රොක් ජලාශය අසල ටැංකිමලේ මාර්ගය දක්වා මාර්ගය පුළුල් කිරීම

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව අනුව උක්ත මාර්ග ගැසට් කිරීම සඳහා ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

<u>05 - 07 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවේ නිර්දේශ මත මීපිටිය ප්‍රජා ශාලාව සංවර්ධනය කර විදුලිය ලබා දීම සඳහා මීපිටිය ප්‍රජා ශාලාව වත්කම් ලේඛනයේ ඇතුළත් කර සභාව වෙත පවරා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව අනුව මීපිටිය ප්‍රජා ශාලාව සභාව වෙත පවරා ගැනීම සඳහා ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 08 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>

පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාව,මහජන පුස්තකාල පාඨකයින්,ජංගම පුස්තකාල පාඨකයින්,බල ප්‍රදේශයේ පෙරපාසල් එක්ව සංවිධානය කරනු ලබන අලුත් අවුරුදු උත්සවය සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය විසින් අනුමත කරන ලද 2022 අයවැය මගින් වෙන් කර ඇති මුදල් ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව අනුව පස්බාගේ කෝරලේ මහජන පුස්තකාලය මගින් සංවිධානය කරනු ලබන අලුත් අවුරුදු උත්සවය ක්‍රියාත්මක කිරිම සඳහා ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

05 - 09 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවේ නිර්දේශ මත මැදගහවතුර කැඩී ගිය පාලමේ එක්රැස් වී ඇති කුණුරොඩු ඉවත් කිරිම සඳහා බැකෝ යන්ත්‍රය යොදා කැඩී ගිය පාලමේ කොටස් ඉවත් කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව ක්‍රියාත්මක කිරිම සඳහා ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

05 - 10 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
WPPF 7405 කැබ් රථයේ ටයර් ගෙවී ඇති බැවින් අලුත් ටයර් ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව අනුව WPPF 7405 කැබ් රථයේ ටයර් දැමීම සඳහා මිල ගණන් කැඳවා ඉදිරි කටයුතු සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 11 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
රඹුක්පිටිය මහජන පුස්තකාලයෙන් ක්‍රියාත්මක කරන ජංගම පුස්තකාල වැඩසටහන් වලට ලබා දීම සඳහා දෙකිඳ,අලුත්ගම,පල්ලේගම,වරකාව,ඉඹුල්පිටිය යන ජංගම පුස්තකාල සඳහා වානේ අල්මාරි සහ ප්ලාස්ටික් පුටු 06 බැගින් 10ක් හා ප්ලාස්ටික් මේස 03ක් ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව ක්‍රියාත්මක කිරිම සඳහා ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

05 - 12 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
රඹුක්පිටිය මහජන පුස්තකාලය මගින් ආරම්භ කර ඇති ජංගම පුස්තකාල සඳහා එම පුස්තකාල ආරම්භ කළ දින සිට මාසයක කාලයක් නොමිලේ සාමාජිකත්වය පිරිනැමීමටත් ඉන්පසුව සාමාජිකයින් වන පාඨකයින් සඳහා සාමාජිකත්වය ලබා දීමේදී සාමාජික ගාස්තු අය කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව ක්‍රියාත්මක කිරිම සඳහා ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

05 - 13 ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා

2022 වර්ෂය සඳහා මා වෙත ලැබී ඇති සභා අරමුදල් වලින් කෞදර්ස්ලැන්ඩ් මාර්ගය,සිල්වාස්ලැන්ඩ් මාර්ගය,රඹුක්පිටිය පන්සල මාර්ගයන් වල ඇති කඩතොලු සකස් කිරිම සඳහා ප්‍රිමික්ස් ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ශාන්තලාල් පෙරේරා මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා තාක්ෂණ නිලධාරි මගින් ඇස්තමේන්තු සකස් කර ඒ අනුව ඉදිරි කටයුතු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 14 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

නාවලපිටිය දෙකිද පාරේ පිහිටා ඇති සේලම්බ්‍රිජ් ගම්මානයේ පවුල් 200 වැඩි සංඛ්‍යාවක් ජීවත් වන අතර දිනපතා විශාල සංඛ්‍යාවක් තම කටයුතු කර ගැනීම සඳහා නගරය දක්වා ගමන් කරයි.මෙම මාර්ගය හරහා පිහිටා ඇති දුම්රිය මාර්ගය ඉතා අනතුරුදායක හෙයින් එම දුම්රිය හරස් මාර්ගය සඳහා විථි ලාම්පුවක් ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව ක්‍රියාත්මක කිරිම සඳහා ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

05 - 15 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

අප බල ප්‍රදේශයේ බව්වාගම,ඉඹුල්පිටිය හා කඩියන්ලෙන යන ප්‍රදේශ වරිපනම් කලාප ලෙස නම් කර වරිපනම් අය කරනු ලබයි.2011 වර්ෂයෙන් පසුව වරිපනම් තක්සේරුවක් සිදු කර නොමැත.වරිපනම් කලාප වල අනුකූලතා සහතික නිකුත් කිරිමේදී ආදායම් පරික්ෂක විසින් තාවකාලික තක්සේරුවක් සිදු කරනු ලබයි.නමුත් ඉහත සඳහන් වරිපනම් කලාප වල විශාල වශයෙන් නව ඉදිකිරිම් කර තිබෙන අතර එම ඉදිකිරිම් සිදු කර තිබෙන බිම් ප්‍රමාණයන් අප ආයතනයේ ගොඩනැගිල්ලක් ඉදිකිරිමේදී අනුමත කරන බිම් ප්‍රමාණයට වඩා අඩු බිම් ප්‍රමාණයක් ඇති ඉඩම් බැවින් එම ගොඩනැගිලි නීත්‍යානුකූල ඉදිකිරිම් බවට අනුමත කළ නොහැකි දේපල වේ.නමුත් ඉහත නීත්‍යානුකූල නොවන දේපල සඳහා වරිපනම් නව තක්සේරුවක් ලබා දීමේදී යම් ගැටලුවක් ඇති බවත් එනමුත් මේ තුළින් වරිපනම් ආදායම අහිමි වන බැවින් ආදායම් පරික්ෂක විසින් කරන ලද සමීක්ෂණය අනුව වාර්තාව සකස් කර පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කර අදාල උපදෙස් කඩිනමින් ලබා ගෙන එම තාවකාලික තක්සේරුව 2022 වර්ෂයේදීම සිදු කිරිම සඳහා ඉදිරි කටයුතු සිදු කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.

ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා

වරිපනම් අය කරන ප්‍රදේශවල විශාල වශයෙන් ඉදිකිරිම් කරනවා වරිපනම් නව තක්සේරුවක් සිදු කර නොමැති නිසා.ඒ වගේ ඒවයින් අපිට මුදල් අය කර ගන්න බැරිද?

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

ආරම්භයක් වශයෙන් මේ වැඩසටහන කරලා බලමු මන්ත්‍රීතුමා

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව ක්‍රියාත්මක කිරිම සඳහා ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

05 - 16 ගරු මන්ත්‍රී වී.මුරලිදරන් මහතා

අපට ආණ්ඩු බලයක් නොමැති අවස්ථාවක දැනට ගරු අගමැති මහින්ද රාජපක්ෂ මැතිතුමා ගෙන්වා 2016 වර්ෂයේ මුල්ගල් තැබූ රොසැල්ල ග්ලිස්ටන් ගම ශ්‍රී ඥාන ගනේෂර් දේවාලයට මුල්ගල් තබා දැනට වසර 7 කට වැඩි කාලයක් ගතවී

ඇත.2022 වර්ෂය අවසානයේ එම දේවාලය විවෘත කර බැතිමතුන්ට පුද සත්කාර කිරිමට අවශ්‍ය කටයුතු දැනට කර ඇති බැවින් සභාව මගින් තේරු කරත්තයක් ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
2022 වර්ෂය සඳහා මා වෙත ලබා දෙනු ලබන ප්‍රතිපාදන වලින් රු:50,000.00 ලබා දීම සුදුසු බවට මම යෝජනා කරන අතර සභාවේ ගරු මන්ත්‍රීවරුන්ද හැකි පමණින් මේ සඳහා දායකත්වය ලබා දෙන මෙන් ඉල්ලා සිටිමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව අනුව ගරු සභාපතිතුමාගේ ප්‍රතිපාදන වලින් රු:50,000.00 ක මුදලක් ලබා දීමටත් අනෙක් ප්‍රතිපාදන ගරු මන්ත්‍රීවරුන්ට හැකි පමණින් මේ සඳහා ලබා දීම සුදුසු බවටත් ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 17 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
ආයතනයේ නිල වෙබ් අඩවිය යාවත්කාලීන කිරිම සඳහා එම වෙබ් අඩවිය නිර්මාණකරුවන් (Xpedia Lanka ආයතනය) විසින් දත්ත මාසිකව ඇතුළත් කිරිම සඳහා රු:7500.00 මුදලක් වැය වන අතර වෙබ් අඩවිය යාවත්කාලීන කරනු ලබන මාසවල පමණක් එම මුදල ගෙවීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී වී.මුරලිදරන් මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව ක්‍රියාත්මක කිරිම සඳහා ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

<u>05 - 18 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
අංක 48,බව්වාගම,නාවලපිටිය යන ලිපිනයේ පදිංචි ආර්.බී මුදිකා නන්දනී මිය විසින් යොමු කර ඇති නිවස අසල පොදු කාණුව සකස් කර දෙන ලෙස කරන ලද ඉල්ලීම් ලිපිය අනුව එම කාණුව සකස් කිරිම සඳහා තාක්ෂණ නිලධාරි විසින් ඇස්තමේන්තු සකස් කර ඒ අනුව ඉදිරි කටයුතු කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව ක්‍රියාත්මක කිරිම සඳහා ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

<u>06. **කාරක සභා වාර්තා සභා සම්මත කිරිම.**</u>

06 - 01 මුදල් කාරක සභාව - 2022.02.14
06 - 02 නිවාස ප්‍රජා සංවර්ධන කාරක සභාව - 2022.02.17
06 - 03 කාර්මික සේවා කාරක සභාව - 2022.02.15
06 - 04 පරිසර හා පොදු පහසුකම් කා.ස - 2022.02.17
06 - 05 ගැටුම් සමථකරණ කාරක සභාව - 2022.02.17

<u>07. **බැංකු සැසදුම් ප්‍රකාශය,අභ්‍යන්තර විගණන වාර්තාව,ලැබීම් සාරාංශය,ගෙවීම් සාරාංශය,ගෙවීම් වාර්තාව,පුස්තකාල ප්‍රගතිය,ආදායම් රැස් කිරිමේ ප්‍රගතිය ඉදිරිපත් කිරිම**</u>

- 2022.01.13 දින සිට 2022.01.31 දක්වා වවුචර් අංක 01 සිට 72 දක්වා ගෙවීම් වවුචර් සභාගත කරන ලදී.
- බැංකු සැසදුම් ප්‍රකාශය

ගිණුම් අංකය - 053100164889286

මාසය - 2022 ජනවාරි

| | | | |
|---|---|---|---|
| 2022.01.01 දිනට මුදල් පොතේ ශේෂය | රු: | 1,638,360.00 | |
| එකතු කළා ජනවාරි මස මුළු ලැබීම් | රු: | 15,503,549.97 | |
| අඩු කළා ජනවාරි මස මුළු ගෙවීම් | රු: | 7,279,755.97 | |
| 2022.01.31 දිනට මුදල් පොතේ ශේෂය | | | රු: 9,862,154.00 |

<u>එකතු කළා</u>

| | | | |
|---|---|---|---|
| නිකුත් කළත් ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් | රු: | 1,810,898.33 | |
| සෘජු ප්‍රේෂණ | | 5,243,270.11 | |
| | | | <u>රු: 7,054,168.44</u> |
| | | | 16,916,322.44 |

<u>අඩු කළා</u>

| | | | |
|---|---|---|---|
| බැංකු ගාස්තු | රු | 108.00 | |
| අත ඉතිරි මුදල් | රු: | 62,612.35 | |
| තැම්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් | රු: | 4,414.87 | |
| අගරු ගාස්තු | රු: | <u>250.00</u> | <u>රු: 67,385.22</u> |

2022.01.31 දිනට බැංකු ප්‍රකාශය අනුව ශේෂය **<u>රු:16,848,937.22</u>**

- 2022 ජනවාරි මස ගෙවීම් සාරාංශය

| විස්තරය | මුදල (රු) |
|---|---|
| 01. වැටුප් හා දීමනා | 2,667,953.76 |
| 02. ගමන් වියදම් | - |
| 03. සැලසුම් හා උපකරණ | 253,043.90 |
| 04. ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියාව හා නඩත්තුව | - |
| 05. ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 47,836.06 |
| 06. පොලී ගෙවීම් ලාභාංශය හා ප්‍රසාද මුදල් | 29,405.99 |
| 07. ආධාර මුදල් දායක මුදල් සහනාධාර | - |
| 08. විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | - |
| **පුනරාවර්ථන වියදම් එකතුව** | **2,998,239.71** |
| 09. ප්‍රාග්ධන වැය | - |
| 10. ණය ආපසු ගෙවීම් | 185,521.02 |
| **ප්‍රාග්ධන වැය එකතුව** | **185,521.02** |
| **පුන:වැය හා ප්‍රාග්:වැය මුළු එකතුව** | **3,183,760.73** |
| විවිධ ණය හිමියන් | 292,829.79 |
| කර්:ණය හිමියන් (309-3-1) | - |
| කර්:ණය හිමියන් (309-3-111) | 3,831,918.89 |
| කර්:ණය හිමියන් (304-5) | - |
| 10% කර්මාන්ත තැම්පත් | - |
| විවිධ තැම්පත් | 2,170.00 |
| මුද්දර තැම්පත් | - |

| | |
|---|---|
| දේපල ණය | 9,774.13 |
| සේවක ණය | 190,338.00 |
| අත්තිකාරම් | - |
| සමුච්චිත අරමුදල | - |
| ලිපි ද්‍රව්‍ය ගබඩා අත්තිකාරම් | - |
| ජල ගබඩා අත්තිකාරම් | - |
| අගරු චෙක්පත් | - |
| කර්:ණය ගැතියන් | - |
| **එකතුව** | 4,327,030.81 |
| **2022.01.31 දක්වා මුළු ගෙවීම් එකතුව** | **7,510,791.54** |

- 2022 ජනවාරි මස ලැබීම් සාරාංශය

| • අය විෂයය නාමයන් | මුදල (රු) |
|---|---|
| 10 වරිපනම් හා බදු | 490,931.32 |
| 20 කුලී | 22,430.46 |
| 30 බලපත්‍ර ගාස්තු | 209,608.00 |
| 40 සේවා සඳහා ගාස්තු | 355,166.32 |
| 50 වරෙන්තු ගාස්තු | 1,053.96 |
| 60 වෙනත් ආදායම් | 7,257,460.55 |
| 70 වෙනත් ආධාර | 283,654.76 |
| පුනරාවර්ථන හා ප්‍රාග්ධන ආදායම් එකතුව | 11,171,305.37 |
| ජල ණය ගැතියෝ | 6,600.00 |
| ජල තැම්පත් | 3,500.00 |
| මුද්දර | 20,075.00 |
| විවිධ තැම්පත් | 10,384.62 |
| සේවක ණය | 139,055.00 |
| කර්මාන්ත තැම්පත් | 28,724.15 |
| දේපල ණය | 9,774.13 |
| විවිධ ණය ගැතියෝ | - |
| අත්තිකාරම් පියවීම | - |
| රු 25 මුද්දර | 1,275.00 |
| කර්මාන්ත ණය ගැතියෝ | 287,241.50 |
| වෙනත් ලැබීම් | 250.00 |
| 2022.01.31 දක්වා මුළු ලැබීම් | **506,879.40** |

## 08.ටෙන්ඩර් මණ්ඩලය

08 - 01 පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව සඳහා වෙළඳ බලපත්‍ර 500 ක් මුද්‍රණය කිරිම සඳහා මිල ගණන් කැඳවීම.

| Rajah Press,Nawalapitiya | Midland Printers,Nawalapitiya | Solid Net,Nawalapitiya |
|---|---|---|
| 15500.00 | 16000.00 | 16500.00 |

මේ පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති "Rajah Press,Nawalapitiya"යන ආයතනයෙන් අදාල කාර්යය ඉටු කර ගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 02 පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාව මගින් පාලනය වන පෙර පාසලේ ළමුන් 50 දෙනෙකු සඳහා නිල ඇඳුම් 02 බැගින් ලබා දීමට මිල ගණන් කැඳවීම.

| විස්තරය | Fashion Park Lanka (PVT)Ltd,Nawalapitiya | City Point,Ginigathena | Tata Tex,Colombo 11 | Vilasitha Dress Point,Nawalapitiya |
|---|---|---|---|---|
| ළමා ටී ෂර්ට් | 62500.00 | 67500.00 | 90000.00 | 67500.00 |
| පොලියෙස්ටර් 150Y | 40000.00 | 60000.00 | 60000.00 | 56250.00 |

මේ පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති “Fashion Park Lanka (PVT)Ltd,Nawalapitiya”යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 03 සභාව සතු 31 - 9698 ජීප් රථය සඳහා Recondition ඇන්ජිමක් මිලදී ගැනීමට මිල ගණන් කැඳවීම.

| ඔමේගා මෝටර්ස්,ගෙලිඔය | විජය මෝටර්ස්,මහනුවර | මෝටර් එන්ටර්ප්‍රයිසස්,මහනුවර | කොඩිතුවක්කු මෝටර්ස්,මහනුවර |
|---|---|---|---|
| 455000.00 | 390000.00 | 415000.00 | 420000.00 |

මේ පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත මිල ගණන් තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත යොමු කර එහි තීරණය අනුව ඉදිරි කටයුතු කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

08 – 04 සභාව සතු 252 – 6380 අංක දරණ කැබ් රථය සඳහා රේඩියේටරයක් මිලදී ගැනීමට මිල ගණන් කැඳවීම.

| මෝටර් එන්ටර්ප්‍රයිසස්,මහනුවර | කොඩිතුවක්කු මෝටර්ස්,මහනුවර | අප් කන්ට්‍රි මෝටර්ස්,නාවලපිටිය | විජය මෝටර්ස්,නාවලපිටිය | ඔමේගා මෝටර්ස්,ගෙලිඔය | රත්නවීර ගැරේජ්,නාවලපිටිය |
|---|---|---|---|---|---|
| 49500.00 | 48000.00 | 63000.00 | 47400.00 | 49500.00 | 45000.00 |

මේ පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත මිල ගණන් සපයා ඇති “රත්නවීර ගැරේජ්,නාවලපිටිය”යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 05 පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාව සඳහා අවශ්‍ය අඹ ලෑලි 10ක් (දිග අඩි 6 * පළල අඟල් 09 * ඝනකම අඟල) මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.

| ජයන්ති ලී වෙළඳසැල හා ලී මෝල,නාවලපිටිය | සුජීව ලී මෝල හා වෙළඳසැල,නාවලපිටිය | තරිඳු ලී මෝල හා වෙළඳසැල,නාවලපිටිය |
|---|---|---|
| 11700.00 | 12500.00 | 10000.00 |

මේ පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති “තරිඳු ලී මෝල හා වෙළඳසැල,නාවලපිටිය”යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 06 පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාවේ උඩු මහල සඳහා තිරරෙදි දැමීම සඳහා මිල ගණන් කැඳවීම.

| Kiruthisha Curtain,Nawalapitiya | | Kumar Tailors,Nawalapitiya | Fashion Park,Nawalapitiya |
|---|---|---|---|
| Linen Cloth | Normal | | |
| 488370.00 | 442450.00 | 529600.00 | 512150.00 |

මේ පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති “Kiruthisha Curtain,Nawalapitiya”යන ආයතනයෙන් අදාල කාර්යය ඉටු කර ගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 07 පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාව සඳහා අවශ්‍ය ගොඩනැගිලි ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.

| ද්‍රව්‍යය | කේශව හාඩ්වෙයාර්,බව්වාගම,නාවලපිටිය | සමන් හාඩ්වෙයාර්,දෙකිඳ පාර,නාවලපිටිය | තෙෂාරා හාඩ්වෙයාර්,මීපිටිය, නාවලපිටිය |
|---|---|---|---|
| මැටල් අඩි 01 | 85.00 | 90.00 | 90.00 |
| වැලි අඩි 01 | 176.00 | 180.00 | 180.00 |
| මි.මී 12 කම්බි | 1390.00 | 1420.00 | 1430.00 |
| සිමෙන්ති මිටි 01 | 1645.00 | 1650.00 | 1650.00 |

මේ පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති "කේශව හාඩ්වෙයාර්,බව්වාගම,නාවලපිටිය"යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරීම සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 08 පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව සඳහා මල් පෝච්චි මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.

| සරසි එන්ටර්ප්‍රයිසස්,ගිනිගත්හේන | | ඉන්ද්‍රජිත් කොන්ක්‍රීට් වර්ක්ස්,නාවලපිටිය | | මොඩර්න් හෝම් අයිඩියාස්,නාවලපිටිය | |
|---|---|---|---|---|---|
| අඩි 2*2 මල් පෝච්චි | 1600.00 | වී හැඩ මල් පෝච්චි අඩි 1 ½ | 700.00 | අඩි 1 ½ බොංගෝ පෝච්චි | 775.00 |
| හැඩ මල් පෝච්චි අඩි 01 | 550.00 | රවුම් හැඩ මල් පෝච්චි අඩි 2 ½ | 180.00 | අඩි 1 ½ හැඩ බොංගෝ | 900.00 |
| හැඩ මල් පෝච්චි අඩි 1 1/2 | 850.00 | වී හැඩ මල් පෝච්චි අඩි 1 | 600.00 | අඩි 1 ½ ටේපර් පෝච්චි | 750.00 |
| අඩි 1*1 හතරැස් | 700.00 | | | | |

මේ පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත මිලදී ගැනීම් සිදු කිරීමේදී මල් පෝච්චි වල තත්ත්වය පිළිබඳ සැලකිල්ලක් දැක්විය යුතු බැවින් මෙම මිල ගණන් තාක්ෂණික කමිටුව වෙත යොමු කර එම කමිටුවේ තීරණය අනුව කටයුතු කිරීම සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 09 සභාව සඳහා අවශ්‍ය ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.

| අනු අංකය | අයිතමය | L.H Chandrasekara,Kandy | ශ්‍රී ලංකා ස්ටෝර්ස්,නාවලපිටිය | සුපර්කොම් ට්‍රේඩින් ප්‍රයිවට් ලිමිටඩ්,මහනුවර | නිව් ජෙනරල් ට්‍රේඩින්ග් ,මහනුවර | PaperLine Trading (Pvt)Ltd,Kandy | රජයේ වාණිජ නීතිගත සංස්ථාව,මහනුවර |
|---|---|---|---|---|---|---|---|
| 01 | ඡායා පිටපත් කඩදාසි A4-JK80 GMS | 1399.68 | 1250.00 | - | - | 1512.00 | |
| 02 | ඡායා පිටපත් කඩදාසි A4 -Dark Colours | 4.21 | 1870.00 | - | - | 2106.00 | |
| 03 | ඡායා පිටපත් කඩදාසි A4 Rainbow | 989.28 | 885.00 | - | - | 999.00 | |
| 04 | ඡායා පිටපත් කඩදාසි A3-JK 80 GMS | - | 2100.00 | - | - | 2916.00 | |
| 05 | ඡායා පිටපත් කඩදාසි B5-JK 80 JMS | - | 895.00 | - | - | 1134.00 | |
| 06 | ඡායා පිටපත් කඩදාසි - Legal - JK 80 JMS | - | 1510.00 | - | - | 1836.00 | |
| 07 | ඡායා පිටපත් කඩදාසි-A4 | - | 1250.00 | 1296.00 | - | 1512.00 | 1279.99 |
| 08 | පිටපත් සහිත පරිඝණක කඩදාසි -A4 | 7425.00 | 2250.00<br>6115.00 | - | - | 2268.00 | |
| 09 | පරිඝණක කඩදාසි - 70gms ,80 gms | - | - | - | - | 6372.00 | |
| 10 | පරිඝණක කඩදාසි | - | 3650.00<br>9450.00 | - | - | 3726.00 | |
| 11 | පුලිස්කැප් කඩදාසි | 2.28 | 1350.00 | - | 2.45 | 2.70 | |
| 12 | ෆීල්ඩ් නෝට් බුක් | 47.99 | 52.50 | - | - | 69.12 | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 13 | මැමෝ පොත් - ලොකු | - | 297.50 | - | - | 259.20 | |
| 14 | සී.ආර්-03 | 114.48 | 115.20 | - | 119.00 | 113.40 | |
| 15 | සී.ආර්-05 | 167.50 | 172.80 | - | 178.70 | 172.80 | |
| 16 | යතුරු ලියන කඩදාසි (half sheet) | 699.84 | 525.00 | - | 625.00 | 648.00 | 639.99 |
| 17 | රෝනියෝ ෂීට් | 44.40 | 610.00 | - | 510.00 | 594.00 | |
| 18 | ෆැක්ස් රෝල් | 241.92 | 245.00 | 237.60 | 241.00 | 248.40 | |
| 19 | ප්‍රස්තාර කොළ | 1.29 | 1.75 | - | 175.00 | 43.20 | |
| 20 | කාබන් (තනිපිට) | 6.99 | 485.00 | - | 493.00 | 464.40 | |
| 21 | කාබන් (දෙපිට) | 6.99 | 485.00 | - | 493.00 | 464.40 | |
| 22 | බ්‍රවුන් පේපර්ස් | 10.14 | 12.50 | - | 11.30 | 13.16 | |
| 23 | ලෙදර්ට් පේපර්ස් | 281.21 | 195.00 | - | 310.00 | 405.00 | |
| 24 | වාර්නිෂ් ෂීට් | 9.84 | 9.00 | - | 7.75 | 8.64 | |
| 25 | ඩිමයි කොළ | 9.34 | 11.00 | - | 9.60 | 7.18 | |
| 26 | බෝල්ට්පොයින්ට් පෑන් | 10.8 | 10.25 | 16.20 | 7.80 | 10.04 | |
| 27 | කරෙක්ටිව් ප්ලූයිඩ් | - | 52.50 | - | 46.50 | 44.82 | |
| 28 | පැන්සල් | 18.48 | 15.50 | - | 17.00 | 10.80 | |
| 29 | මකන කෑලි | 7.94 | 8.00 | - | 8.50 | 57.40 | |
| 30 | හයිලයිට් පෙන් | 79.49 | 57.50 | - | 48.50 | 64.26 | |
| 31 | පර්මනට් මාකර් | 63.58 | 62.50 | - | 59.00 | 51.30 | |
| 32 | වයිට් බෝඩ් මාකර් | 59.09 | 62.50 | - | 59.00 | 51.30 | |
| 33 | ප්ලැට්ක්නම් | 19.99 | 30.00 | - | 25.00 | 226.80 | |
| 34 | ෆයිල් කවර (රෝස,නිල්,කහ) | 9.54 | 9.50 | 6.48 | 7.85 | 8.20 | 889.99 |
| 35 | බොක්ස් ෆයිල් -2.5 | 116.64 | 357.50 | - | 313.00 | 367.20 | |
| 36 | මැගසින් ෆයිල් -3 | 336.96 | 207.50 | - | 305.00 | 172.80 | |
| 37 | මැගසින් ෆයිල් -4 | 263.25 | 247.50 | - | 305.00 | 243.00 | |
| 38 | මැගසින් ෆයිල් -6 | 336.96 | 267.50 | - | 399.00 | 259.20 | |
| 39 | ගෝඩර් ෆයිල් -3 | - | 207.50 | - | - | 172.80 | |
| 40 | ගෝඩර් ෆයිල් -6 | - | 267.50 | - | - | 259.20 | |
| 41 | ඩබල් ටේප් - 1'' | 81.59 | 82.50 | - | 75.00 | 70.20 | |
| 42 | ඩබල් ටේප් - 2'' | 135.00 | 127.50 | - | 141.00 | 140.40 | |
| 43 | සෙලෝටේප් - 1'' | 138.99 | 35.00 | - | 34.00 | 58.86 | |
| 44 | සෙලෝටේප් - 2'' | 275.50 | 70.00 | - | 57.00 | 118.80 | |
| 45 | බොක්ස් බෝඩ් | 76.99 | 67.50 | - | - | 75.60 | |
| 46 | චිප් බෝඩ් | - | 42.50 | - | - | 313.20 | |
| 47 | බ්‍රිස්ටල් බෝඩ් | 25.29 | 25.00 | - | 23.75 | 19.98 | |
| | පෑඩ් ඉන්ක් බෝතල් | 146.49 | 165.00 | - | 153.00 | 151.20 | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 48 | 750 ml | | | | | | |
| 49 | කෙම්පික් ගම් කෑන් -4 kg | 2459.99 | 2672.50 | - | 2725.00 | 2484.00 | |
| 50 | ගම් බෝතල් -750 ml1.67 | 166.98 | 152.50 | - | 119.00 | 129.60 | |
| 51 | ලියුම් කවර -6*3 | 0.83 | 1.10 | - | 46.50 | 0.91 | |
| 52 | ලියුම් කවර -9*4 | 1.79 | 1.95 | - | 90.00 | 1.67 | |
| 53 | ලියුම් කවර-9*6 | 2.49 | 3.10 | - | 129.00 | 3.07 | |
| 54 | ලියුම් කවර-15*10 | 6.75 | 6.65 | - | 336.00 | 6.58 | |
| 55 | ස්ටේපර් පින්ස් -369 | 35.74 | 33.50 | - | 35.50 | 34.50 | |
| 56 | ඩොට් පිනිස් | 36.59 | 17.50 | - | - | 17.82 | |
| 57 | පේපර් කිල්පස් | 39.49 | 32.50 | - | 36.50 | 34.56 | |
| 58 | ප්ලාස්ක් අඩිරුල් | 35.99 | 17.50 | - | 13.60 | 32.40 | |
| 59 | ස්ටෙන්සිල් | - | - | - | - | - | |
| 60 | ෆයිල් ලේස් පැකට් | 254.99 | 310.00 | - | 196.00 | 135.00 | 734.40 |
| 61 | ටිපෙක්ස් | 78.24 | 52.50 | - | 46.50 | 44.82 | |
| 62 | ඉන්ක් පෑඩ් | 115.56 | 107.50 | - | 155.00 | 158.76 | |
| 63 | Empty CD | - | 37.50 | - | - | 54.00 | |
| 64 | ලැමිනේටින් ඉටිකොළ පැකට් | - | 1850.00 | - | - | 135.00 | |
| 65 | පොලිතින් | 680.40 | 650.00 | - | 710.00 | 702.00 | |
| 66 | බයින්ඩින් ක්ලෝත් 1 | 204.12 | 385.00 | - | 360.00 | 405.00 | |
| 67 | Toner (Canon NPG 28) | 11448.00 | 5750.00 | 8100.00 | 3750.00 | 10152.00 | |
| 68 | Epson ink 77741 | - | - | 3510.00 | 1950.00 | 3132.00 | |
| 69 | Kalculater Casio Mj 120 | 1814.40 | 1297.50 | - | 1200.00 | 1728.00 | |
| 70 | Puncher (L) | 382.32 | 367.50 | 235.00 | 413.00 | 3456.00 | |
| 71 | 369 Stepler Machin | 409.32 | 247.50 | - | 35.50 | 486.00 | |

මේ පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත මිලදී ගැනීම් සිදු කිරිමේදී ලිපි ද්‍රව්‍ය වල තත්ත්වය පිළිබඳ සැලකිල්ලක් දැක්විය යුතු බැවින් මෙම මිල ගණන් තාක්ෂණික කමිටුව වෙත යොමු කර එම කමිටුවේ තීරණය අනුව කටයුතු කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

**<u>09. වෙනත් කරුණු</u>**

සාකච්ඡා කිරිමට වෙනත් කරුණු නොවූ බැවින් ගරු සභාපතිතුමා විසින් පැමිණ සිටි පිරිසට ස්තූතිය පළ කරමින් සභාවේ වැඩ කටයුතු ප.ව 1.00 පමණ අවසන් කරන ලදී.

ලේකම්,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

සභාපති,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

<u>ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා</u>

1994 වෙනකල් අපේ අය තමයි ගිහින් කනත්ත ශුද්ධ කරේ.කොටසක් දැන් මිනිස්සු අල්ලගෙන තියෙන්නේ.වර්මානයේ අත්පත් කරගන්න කටයුතු කරමු.

ගරු මන්ත්‍රී වී.මුරලිදරන් මහතා
වෙස්ට්හෝල් ජනතාවට බොන්න වතුර නෑ සභාපතිතුමා.

ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා
ඔබතුමා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට ලිපියක් යවලා තියෙනවා ඉගුරුඔය ගැටලුව ගැන.ඒක සභාවට අයිති නෑ කියලා තියෙන්නේ.අපිට ඒ වෙනුවෙන් මොකක්ද කරන්න පුලුවන් සභනය.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
අත්පත් කර ගැනීමේ කටයුතු අපි සිදු කරමින් යනවා.ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් තමයි මේ වැඩේ කරන්න ඕනි.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා
ස්වාමීන් වහන්සේට ප්‍රහාරයක් දියත් උනා.උන්වහන්සේ රෝහලේ නැවතිලා ප්‍රතිකාර ගත්තා.ඒ සිදුවීම සම්බන්ධව මං කනගාටු වෙනවා.උන්වහන්සේ වෙනුවෙන් ඉදිරිපත් වෙලා මීට වඩා දෙයක් කරන්න තිබුණා අපිට.මං ගිය සභාවෙත් කථා කරා දෙල්ගහඇල්ල සොහොන අසලින් ඇති පාර සම්බන්ධව.මේකට දැඩි විරෝධයක් ගම තුළ ඇති වෙලා තියෙනවා.මොල්ලිගොඩ මන්ත්‍රීතුමා මේකට සම්බන්ධයක් තියෙනවා කියලා රාවයකුත් යනවා.මේ ගැන අපි සොයා බලන්න කටයුතු කරමු.ගලබඩ වත්තේ ඉඩම් ලබා දීමේ කටයුතු සිදු වෙන්නේ කොහොමද සභාපතිතුමා.සේලම්බ්‍රිජ් ප්‍රදේශයේ දුම්රිය හරස් මාර්ගයක් තියෙනවා.එතන ඉතාම අනතුරුදායකයි එතන.ඒ නිසා එතනට වීදී ලාම්පුවක් දැම්මොත් හොඳයි සභාපතිතුමා.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
අපි ඒ පාරට සභා තීරණයක් අරන් තිබුණා කලින් සභාවකදී.ඒ ගැන සොයා බලලා ඉදිරි කටයුතු කරමු.ගලබඩ වත්තේ ඉඩම් ලබා දීමෙන් රැකියා අවස්ථාවන් බිහි වෙනවා.උසස් තත්ත්වයේ දෙනුන් තමයි ගෙන්නන්නේ.ලංකාවේ කිරි නිෂ්පාදනය ලංකාවේම සිදු කරගන්න එක තමයි මේකෙ අරමුණ.කිරි ආශ්‍රිත නිෂ්පාදනත් සිදු කරනවා.
ගරු මන්ත්‍රී එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා
මිරිස් ව්‍යාපෘතිය සඳහා ගොවීන් 100 දක්වා වැඩි කරන්න කටයුතු කරනවා.වත්තේ තියෙන හිස් ඉඩම් තමයි කිරි ව්‍යාපෘතිය සඳහා දෙන්නේ.වත්තටත් බද්දක් අය වෙනවා.

ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා
දෙල්ගහඇල්ල සුසාන භූමියේ වැට කොබෙවත්ත මන්ත්‍රීතුමියගේ අරමුදල් වලින් ගැහුවට පස්සේ එතනින් වෙන වැටක් ගහලා.ගම තුළ ඒකට විරෝධයක් තියෙනවා.මාත් සල්ලි ගත්තා කියලා රාවයක් යනවා.ඒ ගැන බැලුවොත් හොඳයි.මගේ නමටත් ඒක හොඳ නෑ.

ගරු මන්ත්‍රී එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය
ගිය සභා වාරයේ මං වැවේගම වතුර ගැටලුව ගැන කථා කරා.නමුත් බලන්න වත් ආවේ නෑ.මං 2018.09.26 ආණ්ඩුකාරතුමාට යොමු කළා ලිපියක්. ආණ්ඩුකාරතුමාගේ දියණිය කිව්වා ලක්ෂ 20ක් දෙන්නම් කියලා.එතුමිය ඉල්ලීම පළාත් පාලනයට යොමු කරලා තියෙනවා.පළාත් පාලනය සභාවට ලිපිය යොමු කරලා තියෙනවා.මේ වෙනකල් කිසිම දෙයක් වෙලා නෑ.ඇමතිතුමා ඇවිත් මාව විවේචනය කරලා තිබුණා.මේ දේවල් සිදු උනේ ඒ අප්‍රසාදය නිසා තමයි.කාගෙවත් කේලම් අහලා ඔය වගේ ප්‍රකාශ කරනවට මං කැමති නෑ වගේම ඒ සම්බන්ධයෙන් මං කනගාටුව පළ කරනවා.ගිය වසරේ මගේ ප්‍රතිපාදන වලින් කර්මාන්තය කරගන්න ඇස්තමේන්තු හදාගන්න මාස 06 වගේ කලින් මං සභාවට ආවම තාක්ෂණ නිලධාරි කිව්වා එදා විගණනයෙන් ඇවිත් කියලා.ඊට පස්සේ දවසේ කිව්වා යන්න එක වාහනයයි තියෙන්නේ කියලා.වාහනේ කැඩිලා කිව්වා.නැත්නම් තාක්ෂණ නිලධාරි කාර්යාලයේ නෑ.ටෙන්ඩර් වලට සභාව සාකච්ඡා කරන්න ඕනි.පනතේ ඒක තියෙනවා.ගොනු වෙන් කරලා තියෙන එක හොඳ දෙයක්.නමුත් ඒකෙත් පැහැදිලි බවක් නෑ.අඹ ලැලි වලට මිල ගණන් කැඳවලා තිබුණට ඒවා මොනවටද කියලා වත් නෑ.මගේ ලියුම ගැන පොඩ්ඩක් බලන්න සභාපතිතුමා.ඇමතිතුමා මාව ඡන්දේ දවසේ මාව විවේචනය කරා.කෙහෙළිය ඇමතිතුමත් එක්ක වැඩ කරලා ආසනේට මං ලක්ෂ 50ක් ගෙනාවා.

<u>ගරු මන්ත්‍රී එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා</u>

වැවේගමට ලක්ෂ 1 ½ බට ලැබුණා.බට ප්‍රමාණය මදි උනා.ගමේ අයගෙනුත් බට ගත්තා.නමුත් සාර්ථක ව්‍යාපෘතියක් අපි කළා.දුම්රිය හරස් මාර්ගයෙන් බට දැමීමේදී අපි අනුමැතිය ලබා ගෙන තිබුනේ නෑ.ගරු ඇමතිතුමා දුරකථනයෙන් කථා කරලා තමයි වැඩේ කරේ.පෙත්සම් ගිහිත් තිබුණා ගමේ අයගෙන් ඒකට.වහාම ගලවලා ඉවත් කරගන්න කියලා කිව්වා.නමුත් බට තියෙනවා.ඒ වගේම වැවේගම කොට්ඨාසයේ ඉඩම් 50ක් දුන්නා.ඔබතුමියගේ පක්ෂයේ අපේක්ෂකයින්ටත් හම්බ උනා.අපේ දේශපාලන නායකයා මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා.දෙකිද දියුණු කළේ ඇමතිතුමා.ඔබතුමිය ඇමතිතුමා ගැන කිව්ව දේ ගැන මං කනගාටු වෙනවා.ඔබතුමිය ඡන්ද ව්‍යාපාරයේදී ඇමතිතුමාට එක ඡන්දයක් වත් දෙන්න කියලා නෑ.ගමට වැඩ කරපු කෙනෙකුට එහෙම කිව්ව එක ගැන මං කනගාටු වෙනවා.කිතුල්ගම බස් රථයක් 2.00 වෙනකොට දෙකිදට යනවා.ඒකෙ පාසල් ළමුන්ට යන්න පුලුවන්.